කොළඹ විශ්වවිද්‍යාලය
ශාස්ත්‍ර පීඨය
ශාස්ත්‍රවේදී පළමු වසර පරීක්ෂණය
පළමුවන සෙමෙස්තරය - 2022/2023

## SLG 1101– භාෂා ප්‍රවේශය

(පැ දෙකයි)
ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න

---

1. සිංහල භාෂාධ්‍යයනයේ පුරෝගාමීන්ගේ කාර්යභාරය පිළිබඳ සමාලෝචනයක් කරන්න.
   නැතහොත්
   නූතන වාග් විද්‍යාවේ විෂයපථය පුළුල් වී ඇති ආකාරය විමසන්න.

2. මානව භාෂාවේ ජීව විද්‍යාත්මක පදනම පිළිබඳ විවරණයක් සපයන්න.

3. " ව්‍යාකරණය යනු නීති පද්ධතියක් නොව රීති පද්ධතියකි". සිංහල භාෂාව ඇසුරින් විමසන්න.

4. භාෂණය හා ලේඛනය අතර පවත්නා මූලික වෙනස්කම් දක්වා භාෂාවකට ලේඛන ක්‍රමයක ඇති වැදගත්කම සාකච්ඡා කරන්න.

5. " සිංහල හෝඩිය සංශෝධනය කළ යුතු ය." මේ මතයට පක්ෂව හෝ විපක්ෂව කරුණු දක්වන්න.

6. ' භාෂා පරිණාමය' යන සංකල්පය සිංහල භාෂාව ඇසුරින් විමසන්න.

7. භාෂාව සංස්කෘතියේ පදනම වශයෙන් සලකන්නේ ඇයි ? සිංහල භාෂාව ඇසුරින් මේ අදහස පැහැදිලි කරන්න.

8. පහත සඳහන් මාතෘකා අතුරින් තුනක් පිළිබඳ ව සටහන් ලියන්න.
   (අ ) භාෂා නිර්වචනය
   (ආ) භාෂා ආබාධ
   (ඇ) ප්‍රාදේශික උපභාෂා
   (ඈ) පිජින් හා ක්‍රියෝල

****